සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
**Second Term Evaluation -2014**

| | | |
|---|---|---|
| 09 ශ්‍රේණිය<br>தரம் 09<br>Grade 09 | සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය<br>சிங்களமொழியும் இலக்கியமும் வினாத்தாள் -1<br>Sinhala Language & Literature Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>*One Hour* |

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

## I පත්‍රය

- අංක 01 සිට 03 දක්වා නිවැරදි පිළිතුර වරහන තුළ දී ඇති වචන අතරින් තෝරා ලියන්න.

සංවාද භාවිතයේදී රහස් උච්චාරණ (1) ...................................................... ආදිය ඇතුළත් වේ. (2) .............................. වෙන් කර ගැනීමට පසුබිම පිළිබඳ හැඟීමක් ලබා ගැනීමට සිතේ හැඟීම් (3) .............................. බොහෝ විට සංගීතය යොදා ගැනේ.

(ශ්‍රවණයට, ජවනිකා, නිරූපණයට, අධ්‍යාශය ආත්ම භාෂණ)

- පහත දැක්වෙන වාක්‍යවල අක්ෂර වින්‍යාසය වැරදි වචන එක බැගින් ඇත. වැරදි වචනයට යටින් ඉරක් අඳින්න.

(4) පැරණි සාම්ප්‍රධායික බිතු සිතුවම් අදත් නටබුන් අතර දක්නට ලැබේ.

(5) පාසලේ කනිෂ්ඨ හා ජෝෂ්ඨ අංශවල ලී බඩු අළුත්වැඩියා කිරීම එදින සිදු විය.

- පහත දැක්වෙන යෙදුම්වල ඉරි ඇඳි කොටසට අදාළ නිවැරදි ව්‍යාකරණ විධිය තෝරා යටින් ඉරක් අඳින්න.

(6) මොර සූරන වැස්ස - උපමා, නාම විශේෂණ, උපසර්ග

(7) දිරිමත් වී - නිපාත, මිශ්‍රක්‍රියා, පූර්ව ක්‍රියා

(8) සතුටින් කල් ගෙව්වා - ක්‍රියා විශේෂණ, මිශ්‍රක්‍රියා, නිපාත

- මුලින් දී ඇති පදයට බහු අර්ථ පදයක් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(9) සත - සත්ත්වයා, සතුට, සත්‍යය, සතය

(10) පහන් - උදය, ප්‍රදීපය, පාෂාණය, ප්‍රසන්න.

- පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද වැරදි නම් **x** ලකුණ ද ඉදිරියේ ඇති හිස් තැනෙහි ලියන්න.

(11) ත, ථ, ව, ම යන අක්ෂරවලට මුලින් බහුලව යෙදෙන්නේ 'ෂ' අක්ෂරයයි. ..........

(12) අප්‍රාණවාචී උක්ත පදයකට ප්‍රාණවාචී ප්‍රත්‍යයක් එකතු වූ විට ආඛ්‍යාතය බහු වචන වේ. ..............................

(13) 'අකාමකා' යනු යුගල පදයකි ..............................

• පහත දක්වෙන රූඪී (ඉඟිවැකි) සම්පූර්ණ කිරීමට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

(14) අත්තිම ______________ ඇද්දා.

(15) ආකාසෙ ______________ හදනවා

(16) කටුවට ______________ නැති

(මාලිගා, ගහෙන්. තුරුම්පුවත්, වහල්ලට, ගැටේ, ගෙවල්)

(17) පහත දක්වෙන පදවල අර්ථය නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

(මුග්ධ, හම්බාන, සෝමාරියා, ගොන්කවඩියා

(i) ලෝකය, ලණුව, කපටියා, ගෝනා

(ii) මෝඩ, කුඩාඔරුව, අලසයා, මයිනා

(iii) වීර, හරක්බාන, කෑදරයා, කවුඩා

(iv) මූසල, හැරමිටිය, ලෙඩා, කපුටා

(18) නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ප්‍රවෘත්තියක් ලිවීමේ අන්තරාවෘත්ත පිරමීඩාකාර යනු කාලීන-උද්වේගකර ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමයි.

(ii) පුවත්පත් වාර්තාවක සිරස්තලය සැකසෙන්නේ සිද්ධියට අදාළ විශේෂ කරුණකිනි.

(iii) කුණ්ඩලිය යනු හර්ෂාදී ලකුණට යෙදෙන තවත් නමකි.

• පහත දක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා ලියන්න.

(19) පුරාණයේ සිටි මිනිසුන් විසින් ______________ පිදුම් ලැබූහ.

(දෙවිදේවතාවෝ, දෙවිදේවතාවන්)

(20) සේනාරත්න මුල් ගුරුතුමා අමාරුවෙන් කතාව ______________

(පටන් ගත්තෝය, පටන් ගත්තේ ය)

(ලකුණු 40)

The National e-learning Portal for The General Education

(7) (i) එන රිවි බිඹු දුලා ගිරග බලායා
ගිරි නිල්මල් තුලා පිල් සසලායා

...................................................................

...................................................................

(අ) මෙහි ඉතිරි කවි පාද දෙක ලියන්න. (ලකුණු 02)

(ආ) මේ කවිය කුමන සංදේශයකින් උපුටා ගත්තද? (ලකුණු 01)

(ii) පහත දැක්වෙන වචන, අර්ථය වැඩි දියුණු කරන උපසර්ග යොදා නැවත ලියන්න.

(අ) පිරිසිදු ...................................................

(ආ) දූල ................................................... (ලකුණු 02)

(iii) චන්ද්‍රිකා තාක්ෂණයේ පුරෝගාමියා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද? (ලකුණු 01)

(iv) "මගේ ජීවිතේ හැටියට මට උඹලා පිරිමහින්නේ නෑ"

(අ) මෙහි 'උඹලා' යැයි කියන්නේ කාටද?

(ආ) 'රත්මුතු දුව හා තවත් ජනකතා' කෘතියේ කතුවරයා කවුරුන් ද? (ලකුණු 02)

(v) පුවත්පත් වාර්තාකරුවකු සතු වගකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

The National e-learning Portal for The General Education

## II පත්‍රය

- ප්‍රශ්න අංක 1, 2 ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) පංතියේ දී ඔබ සහභාගී වූ කණ්ඩායම් ව්‍යාපෘතිය ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) දේශාභිමාන ගීත එකතුවක් සැකසීමේ කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී ඔබ තෝරාගත් ගීත දෙකක මුල් පද ලියන්න. (ලකුණු 04)

(ii) මේ සඳහා අවශ්‍ය ගීත ආදිය සොයා ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) කණ්ඩායමක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) ඔබ කළ කණ්ඩායම් ව්‍යාපෘතිය ඇගයීමේ දී ගුරුතුමා/ගුරුතුමිය අදාළ කරගත් නිර්ණායක දෙකක් ලියන්න. (ලකුණු 04)

(v) ඔබගේ පංතියේ අනෙකුත් කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමෙන් ඔබ ලබාගත් ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(2) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

(i) අපෙන් ඈත් ව යන සාරධර්ම.

(ii) ජන කවියෙන් හෙළි වන ජන ජීවිතය.

(iii) ළමා පරපුර රටේ අනාගතයයි.

(iv) පුහු ආඩම්බරය විනාශයේ මුලයි. (ලකුණු 14)

(3) ඔබේ විදුහලේ වසර දහයක් සේවය කර උසස් වීමක් ලබා පාසලෙන් ඉවත්ව යන ගුණවර්ධන ගුරුපියාණන්ට උපහාර පිදීමේ උළෙල 2014 නොවැම්බර් මස 20 වන දින පැවැත්වීමට විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය තීරණය කොට ඇත. විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ පැවැත්වෙන මෙම උළෙල සවස 2.00 ට ආරම්භ කිරීමට නියමිත ය.

මෙයට සහභාගීවන මෙන් ප්‍රදේශවාසීන්ට ආරාධනා කරනු සඳහා ප්‍රසිද්ධ කිරීමට සුදුසු දැන්වීම් පත්‍රයක් සකසන්න.

(ලකුණු 10)

(4) පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

තුළ සිය දිවි පුරුදු ව විසුව ද නොමද
දුල ගුණ සුදනන් ගෙ නොදනිති දනෝ දද
විල වැඩි මැඩිහු නොදනිති පියුමෙහි සුවඳ
වල බිඟු එමුවරද ගෙන මත්වැ දෙති තද

(ඇ) මෙහි කියන පරිදි මෝඩ ජනයා නොදන්නා දේ කුමක් ද?

(ආ) පියුමෙහි සුවඳ නොදන්නේ කවුරුන්ද?

(ඉ) මී මැස්සන් නද දෙන්නේ කුමක් නිසාද?

(ඊ) අවසාන කවි පාදය ලිහිල් බසින් ලියන්න.

(උ) බබළන, කැලය යන වචන දෙකට සමාන වචන දෙකක් මේ කවියෙන් සොයා ලියන්න.

(ලකුණු 10)

(5) පහත දැක්වෙන පාඨයන් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) "උඹලත් සේවයට ම කැප වෙන්න ඕනෑ"

(අ) මේ ප්‍රකාශයට සවන් දුන් අය කවුද?

(ආ) මේ කියමන උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න. (ලකුණු 02)

(ii) "ආං ඒ ඉසව්ව අල්ලලා හීනියට දිග' කනටි තිරුවක් වෙන් කරනවා කුරුලු පාළුව" සඳහා,

(අ) කනටියක් යනු කුමක් ද?

(ආ) කුරුලු පාළුව වෙන් කිරීමෙන් ගොවියන්ට ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?

(ලකුණු 02)

(iii) "තව පැයකින් අපට මරණය නැත්නම් ජය"

(අ) මේ ප්‍රකාශය කළේ කවුද?

(ආ) මේ පාඩම කවර නම් නවකතාවක් ඇසුරින් සැකසී ඇත් ද? (ලකුණු 02)

(iv) පහත වචනවලට තනි වචන දෙන්න.

(අ) කන්නයක් වගා කිරීම සඳහා මංගල දියවර හැරවීම

(ආ) කමතේ ආරක්ෂක වස්තු බහාලන වළ (ලකුණු 04)

(6) (i) (අ) 'නෑ' යන්න අගට යෙදී රිද්මයානුකූලව කියවෙන ප්‍රස්තාව පිරුළක් ලියන්න.

(ආ) "ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ" යන ප්‍රස්තාව පිරුළෙහි අදහස ලියන්න.

(ලකුණු 04)

(ii) "රුක් අත්තන මල මුදුනේ
බඹරු නටන හැන්දෑවේ
සැදෑ අඳුර පියමං කර
කවුරුද එන්නේ"

(අ) මේ ගීතයෙහි රචකයා නම් කරන්න.

(ආ) මේ ගීතයෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?

(ඉ) මේ ගීතයෙහි පුනරුක්තිය දක්වෙන්නේ කවර කොටසින් ද? (ලකුණු 06)

(මුළු ලකුණු 10)